# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 389 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/03/2024<br>පැය 0550 |

## මාධ්‍ය නිවේදනය

**01. පාසල් ශිෂ්‍යයාවක් හදිසි අනතුරකින් මියයාම - කලවාන පොලිස් වසම.**

2024.03.06 වන දින උදෑසන කාලයේ කලවාන පොලිස් වසමේ මීපාගම ප්‍රදේශයේ පිහිටා ඇති විදුහලක ශිෂ්‍යාවක් බිම ඇද වැටීම හේතුවෙන් නිකට ප්‍රදේශය කොන්ක්‍රිට් ගලක වැදී කලවාන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට කලවාන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 13ක්වූ කුකුලේගම, වන්නිගොඩ ප්‍රදේශයේ පදිංචි පාසල් ශිෂ්‍යාවකි.**

මෘත ශරීරය කලවාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. කලවාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**02. පුරාවස්තු යැයි සැකසිතිය හැකි දේපල සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගෝනගංආර පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින රාත්‍රී කාලයේදී ගෝනගංආර පොලිස් වසමේ 19 කණුව ප්‍රදේශයේ නිවසකදී ගෝනගංආර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු යැයි සැකසිතිය හැකි හිඳි පිළිමයක්, හිටි පිළිමයක්, සැතපෙන පිළිමයක්, තඹ පැහැති ගිරයක් හා රන් පැහැති කාසි 13 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නිදන් වස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - කහටගස්දිගිලිය පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින කහටගස්දිගිලිය පොලිස් වසමේ කුකුලැව ප්‍රදේශයේදී කහටගස්දිගිලිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නිදන් වස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 ත් 39 ත් අතර වයස් වල පසුවන සිප්පුකුලම හා බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කහටගස්දිගිලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින සවස් කාලයේදී දෙමටගොඩ පොලිස් වසමේ වඩුගොඩවත්ත පාලම අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 130 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින සවස් කාලයේදී හෝමාගම පොලිස් වසමේ දුම්රියපල හන්දිය අසලදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින දහවල් කාලයේදී හෝමාගම පොලිස් වසමේ පිටිපන ප්‍රදේශයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කිරිවත්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර උතුර පොලිස් ස්ථානය.

2024.03.06 වන දින සවස් කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ ගල්පාත ප්‍රදේශයේදී කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ගෝඩා ලීටර් 1080 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන පාතකඩ, ගල්පාත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොච්චියාගම පොලිස් ස්ථානය.

2024.03.06 වන දින සවස් කාලයේදී නොච්චියාගම පොලිස් වසමේ අඹගහවැව ප්‍රදේශයේදී නොච්චියාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මූතූර් පොලිස් ස්ථානය.

2024.03.06 වන දින සවස් කාලයේදී මූතූර් පොලිස් වසමේ පච්චනූර් ප්‍රදේශයේදී මූතූර් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 39 ක් වන මූතූර් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මූතූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. නාඳුනන මළ සිරුරක් - පැලියගොඩ පොලිස් වසම.

2024.03.06 වන දින උදෑසන කාලයේදී පැලියගොඩ පොලිස් වසමේ පැලියගොඩ මීගමුව මාර්ගයේ මත්ස්‍ය වෙළඳසැලට හැරෙන සංඥා පුවරුව අසල ඇති කුනු ඇලේ නාඳුනන පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට පැලියගොඩ පොලිස් ස්ථානයට ලද තොරතුරක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැති අතර ඔහු වයස අවුරුදු 35ත් 40ත් අතර වයසේ පසුවන, උස අඩි 05 අගල් 07ක් පමණ වන, තලෙළු යටි රැවුල හා උඩු රැවුල සම්පූර්ණයෙන් වවා ඇති සාමාන්‍ය සිරුරක් සහිත පුද්ගලයෙකු වන අතර**

**උඩුකයට කමිසයක් හා නිල්පාට හා රතුපාට ඉරි සහිත යටි කයට බොටම් කලිසමක් හැඳ සිටි.**

මෘත ශරීරය පොලිස් මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**11. හදිසි ගින්නක් - ඇල්ල පොලිස් වසම.**

2024.03.07 වන දින අළුයම් කාලයේ ඇල්ල පොලිස් වසමේ ඌව කරදගොල්ල ප්‍රදේශයේ නිවසක හදිසි ගින්නක් හටගෙන ඇති බවට ලද තොරතුරක් මත ඇල්ල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

ගින්න හේතුවෙන් එම නිවසේ කාමරයක් තුල සිටි පුද්ගලයෙකු තුවාල ලබා බදුල්ල රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටී.

**තුවාලකරු වයස අවුරුදු 44ක් වන කරදගොල්ල, ඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර ඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**12. මාරක රිය අනතුරක් - පල්ලෙකැලේ පොලිස් වසම.**

2024.03.06 වන දින සවස් කාලයේ පල්ලෙකැලේ පොලිස් වසමේ මහනුවර පදියතලාව මාර්ගයේ ලක්සෙන්පාය හන්දිය සිට ආයුර්වේද රෝහල කරා යන අතුරු මාර්ගයේදී ලොරි රථයක් හා ත්‍රීරෝද රථයක් එකිනෙක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු සහ පිටුපස අසුනේ ගමන් කල තිදෙනෙකු තුවාල ලබා මැණික්හින්න හා තෙල්දෙනිය රෝහල් වෙත ඇතුලත් කිරීමේදී මැණික්හින්න රෝහල වෙත ඇතුලත් කල කාන්තාවක් මියගොස් ඇත.

මරණකාරිය වයස අවුරුදු 45 ක් වූ හුන්නස්ගිරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.

මෘත ශරීරය මැණික්හින්න රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත් අඩංගුවට ගෙන ඇත. පල්ලෙකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - පොල්ගහවෙල පොලිස් වසම.**

2024.03.06 වන දින උදෑසන කාලයේ පොල්ගහවෙල පොලිස් වසමේ කොළඹ කුරුණෑගල මාර්ගයේ මැද්දලන්ද ප්‍රදේශයේදී අලව්ව දෙස සිට පොල්ගහවෙල දෙසට ධාවනය කළ ලොරි රථයක් රියදුරුට පාලය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගයේ වම් පස ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා පොල්ගහවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රථිකාර සඳහා කුරුණෑගල රෝහලට මාරු කර යවා ප්‍රථිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 36ක් වූ දෙල්ගොල්ල පොල්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.අනතුරට අදාල ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර පොල්ගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2024.03.06 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ මීගමුව කොළඹ ප්‍රධාන මාර්ගයේ කුරන ප්‍රදේශයේදී  මීගමුව දෙස සිට කොළඹ දෙසට ධාවනය කළ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා  බරපතල තුවාල ලබා මීගමුව  රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත .**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල කාර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - පයාගල පොලිස් වසම.

2024.03.06 වන දින රාත්‍රී කාලයේ පයාගල පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ දකුණු පයාගල දුම්රියපොල අසලදී  ගාල්ල දෙස සිට කළුතර දෙසට ධාවනය කළ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව දුම්රියපල අසල ගේට්ටු කණුවේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා නාගොඩ  රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39ක්වූ බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**